**මිල්ලනිය ප්‍රාදේශීය සභාව - 2021**

**-------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**--------------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**--------------------------------**

මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**---------------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**-----------------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන් ,ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5** **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6** **මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1** **පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම**

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රමිතයේ 16.5 වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශිය සභාව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට අමතරව සේවා කාර්ය සාධන ප්‍රකාශනයක් ඉදිරිපත් කළයුතු වුවද, එසේ කර නොතිබුණි. | 2022 වර්ෂයේදී ඉදිරිපත් කරන බව | පළාත් පාලනය සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2020 වර්ෂයේ ප්‍රාග්ධන වියදම් ප්‍රදාන වලින් රු.52,226,872 ක් සහ 2021 වර්ෂයේ ලැබී තිබුණු ප්‍රාග්ධන ප්‍රදාන රු.28,191,664 ක් වත්කම් හා වගකීම් ප්‍රකාශයේ අතිරික්තයේ/ඌණතාවයේ හඳුනානොගත් ප්‍රාග්ධන වියදම්/ප්‍රදාන යටතේ අනාවරණය කළයුතු වුවත්, එම ප්‍රමාණය ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය තුල වැරදි ලෙස ගලපා තිබුණි. | 2022.12.31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශය තුල නිවැරදි කරන බව | මූල්‍ය ප්‍රකාශන තුල නිවැරදිව අනාවරණය කළ යුතුය. |
| (ආ)ස්ථාවර වත්කම්වල රු.3,057,133 ක ප්‍රත්‍යාගණන අලාභය , ප්‍රත්‍යාගණන අලාභය ලෙස අනාවරණය නොකර මූල්‍ය ප්‍රකාශනවල වත්කම් බැහැර කිරීමක් ලෙස වැරදියට අනාවරණය කර තිබුණි. | 2022 වර්ෂය තුල නිවැරදි කරන බව | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) 2021 දෙසැම්බර් 31 දිනට රු.14,123,018 ක මුදල් පොතේ ශේෂය වෙනුවට රු.16,111,439 ක බැංකු ශේෂය මූල්‍ය ප්‍රකාශනවල සටහන් කිරීම නිසා මුදල් ශේෂය රු.1,988,421 කින් වැඩියෙන් දක්වා තිබුණි. | වරද පිළිගන්නා බවත්, 2022.01.01 දිනට නිවැරදි කිරීමට කටයුතු කරන බව | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

**1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

-----------------------------------------

| විෂයය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ගිණුම් විෂයයන් 02 කට අදාලව මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වටිනාකම හා ඊට අනුරූපී වාර්තාවල දැක්වෙන වටිනාකම අතර රු. 15,512,495ක වෙනසක් විය. | 2022 මූල්‍ය ප්‍රකාශන තුලින් නිවැරදි කරන බව | මූල්‍ය ප්‍රකාශන ශේෂ හා උපලේඛන ශේෂ සමාන විය යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

---------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.14,564,920 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.13,843,720 ක් විය.

**2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

-----------------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2021 දෙසැම්බර් 31 දිනට 2018 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.1,193,602 ක් හා මුද්දර ගාස්තු රු.34,127,839 ක් විය. | හිඟ මුදලින් කොටසක් ලැබී ඇති බව | හිඟ ආදායම් එකතු කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

-------------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 මාර්තු 20 දිනෙන් පසුව නව ප්‍රාදේශිය සභාවක් ලෙස ස්ථාපිත වු මිල්ලනිය ප්‍රාදේශිය සභාවට බණ්ඩාරගම ප්‍රාදේශිය සභාවෙන් ලැබිය යුතු වත්කම් , වගකීම් , ආදායම් හා වියදම් නිසි පරිදි බෙදා වෙන් කර ලබාදීම 2022 අගෝස්තු 19 දින දක්වාම සිදු නොවීම නිසා මිල්ලනිය ප්‍රාදේශිය සභාවේ ස්ථාවර වත්කම් ලේඛන | පිළිතුරු ලබා දී නොමැති බව | වත්කම් බෙදා වෙන් කර ගැනීම කඩිනම් කළ යුතුය. |

නඩත්තු කිරීම , සභාවට අයිති ඉඩම් හා ගොඩනැගිලි පොත් වලට ගැනීම හා ඒවායේ ආරක්ෂාව තහවුරු කිරීම හා අනෙකුත් වත්කම් , වගකීම් පිළිබඳ නිසි තහවුරුවක් ලබා ගැනීමට නොහැකි වී තිබුණි.මිල්ලනිය ප්‍රාදේශිය සභාව සතු රු.12,213,570 ක් වටිනා ස්ථාවර වත්කම් බණ්ඩාරගම ප්‍රාදේශිය සභාවේ ස්ථාවර වත්කම් ශේෂය තුල තිබුණි. තවද මිල්ලනිය ප්‍රාදේශිය සභාව පවරා ගැනීමට අපේක්ෂිත හා සභා ප්‍රදේශයට අයත් ස්ථාවර වත්කම් පිළිබඳ ලේඛනයක් සභාව සකස් කර නොතිබුණි.

### 3.2 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභාවේ භාවිතයට ගනිමින් පවතින හලර් යන්ත්‍රයේ කොම්පොස්ට් නිෂ්පාදන ධාරිතාවය දිනකට ටොන් 01 සිට 1.5 අතර පවති. 2021 වර්ෂයේදී ටොන් 27.34 නිපදවා අලෙවි කර තිබුණු අතර 2022 වර්ෂයේ අගෝස්තු 10 දක්වා එම ප්‍රමාණය ටොන් 9.16 ක් විය. නමුත් 2021 වර්සයේදී පැයට ටොන් 01 ක නිෂ්පාදන ධාරිතාවයෙන් යුත් හලර් යන්ත්‍රය රු.7,129,625 කට මිලට ගෙන තිබුණද එය ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. ඊට අමතරව කොම්පෝස්ට් නිෂ්පාදන ගොඩනැගිල්ලේ වහළ සහ අපදියර පද්ධතිය සඳහා 2021 වර්ෂයේදී රු.5,000,000 ක වියදමක් දරා තිබුණි.වෙනත් සභා වලින් කසළ ලබාගෙන කොම්පෝස්ට් නිෂ්පාදනය අරමුණක් වුවද ඒ සඳහා කටයුතු කර නොතිබුණි. | ප්‍රතිපාදන අහිමිවන බැවින් මිලදීගත් අතර ඉදිරියේදී භාවිතා කිරිමට කටයුතු කරන බව | වත්කම් උපයෝජනය කළ යුතුය. |